# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,116 — 1960 අප්‍රේල් 25 වැනි සඳුද — 25.4.1960**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**වර්ෂ 1939 නො. 29 දරන ගොවි ද්‍රව්‍ය පාලනය පිළිබඳ ආඥපනත**

**6 වැනි වගන්තිය යටතේ නිවේදනයයි**

වර්ෂ 1947 සැප්තැම්බර් මස 24 වැනි දින නො. 9,773 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද ප්‍රකාශනයෙන් සංශෝධිත ප්‍රකාර වර්ෂ 1939යේ නො. 29 දරන ගොවි ද්‍රව්‍ය පාලනය පිළිබඳ ආඥපනතේ 6 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මට පැවරී ඇති බලතල අනුව ආහාර, වාණිජ හා වෙළඳ ඇමති තැන්පත් මොහොට්ටාල්ලාගේ ඩිංගිරි බණ්ඩා වන මම, ගොවි ද්‍රව්‍ය පිළිබඳ පාලන මණ්ඩලයේ අදහස් විමසීමෙන් පසු මෙම නිවේදනයෙන් නියෝග කරනු ලබන්නේ—

1. (අ) මෙහි පහත පෙනෙන උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ඕනෑම ද්‍රව්‍යයක් මෙරටට ගෙන්වීමේ බලපත්‍රයක් ලබාගැණීමට බඩු ගෙන්වන තැනැත්තා එකී උපලේඛනයේ 3 වෙනි සහ 4 වෙනි තීරවල පෙනෙන අනුපාතය හා මිළ ගණන් අනුව මිළයට ගතයුතු බවත් ;

(ආ) ඉහත කී 6 වෙනි වගන්තියේ 1 වෙනි උපවගන්තිය යටතේ මීට ප්‍රථම නිකුත් කරන ලද නිවේදන සියල්ලක්ම අවලංගු කරන බවත් ය.

ඇම්. ඩී. බණ්ඩා,
ආහාර, වාණිජ හා වෙළඳ ඇමති.

1960 අප්‍රේල් මස 20 වැනි දින,
කොළඹ, ආහාර, වාණිජ හා වෙළඳ අමාත්‍යාංශයේ දීය.

### උපලේඛනය

| 1<br>පාලන ක්‍රමය යටතේ මෙරටට ගෙන්වන ද්‍රව්‍ය | 2<br>මෙරට උපදවන ද්‍රව්‍ය | 3<br>පිටරටින් ගෙන්වන ද්‍රව්‍යවලට මෙරට ද්‍රව්‍යවලින් ගතයුතු ප්‍රමාණය | 4<br>මෙරට ද්‍රව්‍ය හොණ්ඩරයක මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| වියළි මිරිස් ... ... | ලංකාවේ වවන මිරිස්— | | |
| | I වර්ගය හෝ ... | 200 : 1 ... | 153 13 |
| | II වර්ගය හෝ ... | 200 : 1 ... | 137 25 |
| | III වර්ගය හෝ ... | 200 : 1 ... | 121 39 |
| සියඹලා ... ... ... | මෙරට සියඹලා ... | 200 : 1 ... | 29 12 |
| රතුළූනු ... ... ... | මෙරට රතුළූනු ... | — ... | — |
| කෝපි ... ... ... | මෙරට කෝපි ... | — ... | — |
| ගම්මිරිස් ... ... ... | මෙරට ගම්මිරිස් ... | 200 : 1 ... | 377 44 |
| කහ ... ... ... | මෙරට කහ ... | — ... | — |
| අබ ... ... ... | මෙරට අබ ... | — ... | — |
| මුංඇට ... ... ... | මෙරට මුංඇට— | | |
| | I වර්ගය ... | 200 : 1 ... | 47 04 |
| | II වර්ගය ... | 200 : 1 ... | 42 19 |


**473—ජේ. ඇන්. ආර් 9340—4,960 (4/60).**

# මිළ පාලන දැන්වීම්

කේ. ඇල්. 68 දරණ මිළ නියෝගය — සහල් (තොග සහ සිල්ලර)

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

කළුතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් ගාර්දිය පුංචිහේවාගේ බුද්ධදස ද සිල්වා වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් හා 3 (2) යන වගන්තියෙන්ද මා කෙරෙහි පැවරී ඇති බලතල අනුව—

(1) 1959 නොවැම්බර් මස 25 වැනි දින අංක 11,978 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක කේ.ඇල්. 60 සහ 1959 නොවැම්බර් මස 18 වැනි දින දරණ ආහාර මිළ නියෝගය සහ 1959 ජූනි මස 29 වැනි දින අංක 11,792 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක කේ.ඇල්. 57 සහ 1959 ජූනි මස 14 වැනි දින දරණ මිළ නියෝගයේ 2 වැනි උප ලේඛනයේ 2 සහ 3 වැනි තීරවල සඳහන් සහල් සලාක රාත්තලක මිළද මෙම නියෝගයෙන් 1960 අප්‍රේල් මස 11 වැනි දින සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති 1 වැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් මිළ ගණන් තොග වශයෙන් සහල් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩර යක් එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් තුළ තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(3) තවද, මීට යාකර ඇති 2 වැනි උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් මිළ ගණන් සිල්ලර වශයෙන් සහල් විකිණීමේදී ශුද්ධ බර රාත්ත ලක් එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් තුළ සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(4) තවද, මෙ නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) සහල් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ සහල් වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණ යක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ආ) සහල් ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම විකිණීමක් සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(5) සහල් විකිණීමේදී වෙනත් ද්‍රව්‍යයන් හා මිශ්‍රකොට බාලකිරීමෙන් සහල් නොවිකිණිය යුතු බවත් ;

(6) සහල් විකිණීමේදී සහල් යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහාලනු ලැබේ නම් එහි මිළත් එම උපලේඛනවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සහල් යම් ස්ථානයක හෝ සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකු විසින්ම සහල් සඳහා නියම කරනු ලැබූ වැඩිම මිළ සඳහන් දැන්වීමක් එම ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බවත් ;

(8) එසේම, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා "රාත්තල්" සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව නියම කරමි.

(9) මේ මිළ නියෝගයේ වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සහල් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම හා සහල් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ සහල් ප්‍රමාණය ;

(ඇ) විකුණූ සහල් ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලරද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළදී ගන්නාට දිය යුතු බවත්, මෙයින් නියම කරමි.

1960 අප්‍රේල් මස 12 වැනි දින පෙරවරු 9 ට කළුතරදී අත්සන් කරන ලදී.

ජී. පී. බී. ද සිල්වා,
කළුතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

### 1 වැනි උපලේඛනය

| 1 වැනි තීරය | | 2 වැනි තීරය |
|---|---|---|
| ආදයම් පාලක නිළධාරි තැනගේ කොට්ඨාශය | ප්‍රදේශය | ශුද්ධ බර හාල් හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම තොග මිළ |
| | | රු. ශ. |
| කළුතර ... | කළුතර ... ... | 13 55½ |
| කළුතර ... | මග්ගොන ... | 13 79½ |
| කළුතර ... | වස්කඩුව ... ... | 13 66½ |
| කළුතර ... | අලුත්ගම ... | 13 70½ |
| කළුතර ... | බේරුවල ... ... | 13 81½ |
| පානදුර ... | පානදුර ... ... | 13 53½ |
| පානදුර ... | ගොරකාපොල ... | 13 58½ |
| පානදුර ... | වාද්දූව ... ... | 13 66½ |
| මතුගම ... | මතුගම ... ... | 13 89½ |
| මතුගම ... | වැලිපැන්න ... | 14 2½ |
| මතුගම ... | සපුගහවත්ත ... | 14 4½ |
| මතුගම ... | නෑබොඩ ... ... | 14 8½ |
| අගලවත්ත ... | අගලවත්ත ... | 13 97½ |
| අගලවත්ත ... | ලත්පඳුර ... ... | 14 16½ |
| අගලවත්ත ... | මීගහතැන්න ... | 14 25½ |
| අගලවත්ත ... | බුලත්සිංහල ... | 14 49½ |
| හොරණ ... | හොරණ ... | 13 87½ |
| හොරණ ... | ඉංගිරිය ... ... | 14 16½ |
| හොරණ ... | මිල්ලෑව ... | 14 8½ |
| හොරණ ... | මද්දුරාවල ... ... | 13 95½ |
| හොරණ ... | ගල්පාත ... | 13 83½ |
| හොරණ ... | බණ්ඩාරගම ... | 13 79½ |
| හොරණ ... | පොකුණුවිට ... | 13 87½ |

### 2 වැනි උපලේඛනය

| 1 වැනි තීරය | | 2 වැනි තීරය |
|---|---|---|
| කළුත්ර සහ පානදුර ආදයම් කොට්ඨාශ | ප්‍රදේශය | සහල් ශුද්ධ බර රාත්තලකට අය කළ හැකි වැඩිම සිල්ලර මිළ |
| ගම්මුලාදෑනි කොට්ඨාශය | | ශත |
| 717 ... | දේශාස්ත්‍ර කළුතර ... | 12½ |
| 723 ... | පලාතොට ... | 12½ |
| 725 ... | වේලාපුර කළුතර ... | 12½ |
| 727 ... | කුඩා හීනටියන්ගල ... | 12½ |
| 730 ... | කටුකුරුන්ද ... | 12½ |
| 737 ... | මදිනාකන්ද ... | 13 |
| 710 ... | කුඩා වස්කඩුව ... | 13 |
| 714 ... | මහ වස්කඩුව ... | 13 |
| 715 ... | දෙදියවල ... | 13 |
| 716 ... | උග්ගල්බඩ ... | 13 |
| 718 ... | එතනාමඩල ... | 13 |
| 719 ... | කොහොලාන ... | 13 |
| 720 ... | උක්වත්ත... ... | 13 |
| 721 ... | බොලොස්සගම ... | 13 |
| 722 ... | සේරුපිට ... | 13 |
| 724 ... | ගමගොඩ ... | 13 |
| 726 ... | රෙමුනගොඩ ... | 13 |
| 727ඒ ... | මහ හීනටියන්ගල ... | 13 |
| 728 ... | බෝම්බුවල ... | 13 |
| 729 ... | නාගොඩ ... | 13 |
| 731 ... | කලමුල්ල ... | 13 |
| 732 ... | ඇතගම ... ... | 13 |
| 733 ... | සුවඳච්චිමුල්ල ... | 13 |
| 735 ... | මහ පයියාගල ... | 13 |
| 741 ... | දියලගොඩ ... | 13 |
| 742 ... | මග්ගොන බටහිර ... | 13 |
| 743 ... | මග්ගොන නැගෙනහිර ... | 13 |
| 746 ... | මාගල්කන්ද ... | 13 |
| 747 ... | කරඳගොඩ ... | 13 |
| 748 ... | පොල්කොටුව ... | 13 |
| 749 ... | කන්කානම්ගොඩ ... | 13 |
| 750 ... | විලතර ... ... | 13 |
| 751 ... | දීනගොඩ ... | 13 |
| 753 ... | පරනකඩේ ... | 13 |
| 758 ... | හෙට්ටිමුල්ල ... | 13 |

## 2 වැනි උපලේඛනය—(සම්බන්ධයි)

| කළුතර සහ පානදුර ආදායම් කොට්ඨාශ | 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>සහල් ශුද්ධ බර රාත් තලකට අය කළ හැකි වැඩිම සිල්ලර මිළ |
|---|---|---|
| ගම්මුලාදෑනි කොට්ඨාශය | | ශත |
| 754 | මරදන | 13 |
| 755 | මාලිගාහේන | 13 |
| 756 | මහගොඩ | 13 |
| 757 | මස්සල්ගොඩ | 13 |
| 762 | කළුවාමෝදර | 13 |
| 763 | ගනේගම | 13 |
| 764 | අලුත්ගම බටහිර | 13 |
| 765 | අලුත්ගම නැගෙනහිර | 13 |
| 766 | අලුත්ගම් වීදිය | 13 |
| 769 | වරාපිටිය | 13 |
| 734 | කුඩා පයියාගල | 13 |
| 736 | පිනිදියමුල්ල | 13 |
| 738 | පාලයන්ගොඩ | 13 |
| 739 | මහගම්මැද්ද | 13 |
| 740 | පොතුවිල | 13 |
| 744 | හල්කඳවිල | 13 |
| 745 | මුංහේන | 13 |
| 752 | අම්බෙපිටිය | 13 |
| 759 | පිංහේන | 13 |
| 760 | මොරගල්ල | 13 |
| 761 | මුල්ලෙපිටිය | 13 |
| 767 | කාලවැලි | 13 |
| 768 | පාඩගොඩ | 13 |
| 770 | මාලේවන | 13 |
| 771 | බෙන්දුපිටිය | 13 |
| 772 | ඉඳිගස්තුඩුව | 13 |
| 775 | දේවගොඩ | 13 |
| 776 | ලද්දූව | 13 |
| 797 | කිරන්තිඩිය | 13 |
| 671 | ගොරකාන | 12½ |
| 672 | කෙසෙල්වත්ත | 12½ |
| 673 | සරික්කාමුල්ල | 12½ |
| 674 | ගොරකපොල | 12½ |
| 675 | වේරවත්ත | 12½ |
| 676 | ගල්තුඩේ | 12½ |
| 679 | වලාන | 12½ |
| 680 | බෙක්කෙගම | 12½ |
| 681 | තන්තිරිමුල්ල | 12½ |
| 682 | උඩහමුල්ල පට්ටිය | 12½ |
| 683 | වල්පොල පට්ටිය | 12½ |
| 684 | මාලමුල්ල | 12½ |
| 685 | පට්ටිය | 12½ |
| 686 | පට්ටිය | 12½ |
| 692 | නල්ලූරුව | 12½ |
| 687 | වැකඩ | 12½ |
| 670 | හොරේතුඩුව | 13 |
| 677 | හිරන | 13 |
| 678 | අරුග්ගොඩ | 13 |
| 688 | පින්වල | 13 |
| 689 | කළුදෑවල | 13 |
| 690 | මහවිල | 13 |
| 691 | අළුබෝමුල්ල | 13 |
| 693 | දිබ්බැද්ද | 13 |
| 694 | පමුණුගම | 13 |
| 695 | මහබෙල්ලන | 13 |
| 696 | පින්වත්ත | 13 |
| 697 | තල්පිටිය දකුණ | 13 |
| 697ඒ | තල්පිටිය උතුර | 13 |
| 698 | මහ වාද්දූව නැගෙනහිර | 13 |
| 699 | මහ වාද්දූව බටහිර | 13 |
| 702 | කුඩා වාද්දූව | 13 |
| 703 | මැලෑගම | 13 |
| 704 | මොල්ලිගොඩ | 13 |
| 707 | පොහොද්දරමුල්ල | 13 |
| 708 | පොතුපිටිය | 13 |
| 700 | මැස්ටිය | 13 |
| 701 | ගෝනදූව | 13 |
| 705 | මාවල | 13 |
| 706 | මොරොන්තුඩුව | 13 |

## 2 වැනි උපලේඛනය—(සම්බන්ධයි)

| කළුතර සහ පානදුර ආදායම් කොට්ඨාශ | 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>සහල් ශුද්ධ බර රාත්තලකට අය කළ හැකි වැඩිම සිල්ලර මිළ |
|---|---|---|
| ගම්මුලාදෑනි කොට්ඨාශය | | ශත |
| 709 | කලපුගම | 13 |
| 709ඒ | දෙල්දූව | 13 |
| 711 | පනාපිටිය | 13 |
| 712 | පරදූව | 13 |
| 713 | දියගම | 13 |
| **රයිගම් කෝරළයේ ප්‍රා.ආ.නි. ගේ කොට්ඨාශය** | | |
| 639ඒ | දෙල්ගොඩ | 13 |
| 641 | පනාගොඩ | 13 |
| 642 | ගල්පාත | 13 |
| 656 | රයිගම | 13 |
| 659 | අටුළුගම | 13 |
| 661 | ගැලනිගම | 13 |
| 662 | වැවිට | 13 |
| 663 | බණ්ඩාරගම | 13 |
| 665 | රඹුක්කන | 13 |
| 666 | කඹුරුගොඩ | 13 |
| 667 | ගම්මන්පිල | 13 |
| 604 | පලන්තොරුව | 13 |
| 606 | වැල්මිල්ල | 13 |
| 608 | පොකුණුවිට | 13 |
| 609 | හේනේගම | 13 |
| 610 | කුලුපන | 13 |
| 615 | හොරණ | 13 |
| 616 | මුනගම | 13 |
| 618 | කලුපන | 13 |
| 619 | නම්බපාන | 13 |
| 620 | ඉංගිරිය | 13 |
| 624 | හඳපාන්ගොඩ | 13 |
| 628 | මිල්ලෑව | 13 |
| 634 | යාල | 13 |
| 635 | අඟුරුවාතොට | 13 |
| 636 | යාල | 13 |
| 637 | අඟුරුවාතොට | 13 |
| 639 | පාතකඩ | 13 |
| 640 | යටවර | 13 |
| 641 | පනාගොඩ | 13 |
| 643 | පැල්පොල | 13 |
| 644 | රද්දෙගොඩ | 13 |
| 645 | මිල්ලනිය | 13 |
| 649 | බටගොඩ | 13 |
| 655 | ගුංගමුව | 13 |
| 657 | කොළමැදිරිය | 13 |
| 658 | කිම්මන්තුඩාව | 13 |
| 660 | බමුණුමුල්ල | 13 |
| 664 | වීදියගොඩ | 13 |
| 668 | අලුත්ගම | 13 |
| 629ඒ | කිදෙල්පිටිය | 13 |
| 629 | කිදෙල්පිටිය | 13 |
| 605 | ඔලබොඩුව | 13½ |
| 607 | කුඹුක | 13½ |
| 611 | බටුවිට | 13½ |
| 612 | කහටපිටිය | 13½ |
| 613 | තලගල | 13½ |
| 614 | උඩුව දකුණ | 13½ |
| 614ඒ | උඩුව උතුර | 13½ |
| 617 | මීවනපාලන | 13½ |
| 617ඒ | ගුරුගොඩ | 13½ |
| 618ඒ | වගවත්ත | 13½ |
| 621 | පලාපිටියගොඩ | 13½ |
| 622 | මාපුටුගල | 13½ |
| 623 | ඉලිඹේ | 13½ |
| 623 | බටගම්පොල | 13½ |
| 625 | මෙනේරිගම | 13½ |
| 626 | කඳනිපිටිය | 13½ |
| 627 | අරකාවිල | 13½ |
| 629 | කොටියන්ගොඩ | 13½ |
| 631 | හාඳුන්පැල්පොල | 13½ |
| 633 | වේරවත්ත | 13½ |
| 638 | උඩුවර | 13½ |

## 2 වැනි උපලේඛනය—(සම්බන්ධයි)

| කළුතර සහ පානදුර ආදයම් කොට්ඨාශ | 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>සහල් ශුද්ධ බර රාත්තලකට අය කළ හැකි වැඩිම සිල්ලර මිළ |
|---|---|---|
| ගම්මුලාදනි කොට්ඨාශය | රයිගම් කෝරළයේ ප්‍රා.ආ.නි. ගේ කොට්ඨාශය | ශත |
| 638ඒ | ... කෙසේල්හේනාව ... | 13½ |
| 646 | ... ලන්ගන ... | 13½ |
| 647 | ... හල්තොට ... | 13½ |
| 650 | ... රෙමුන ... ... | 13½ |
| 651 | ... ලබුගම ... ... | 13½ |
| 652 | ... කෙම්මන්තුඩාව ... | 13½ |
| 653 | ... යාලගල ... ... | 13½ |
| 654 | ... වැලිගල ... ... | 13½ |
| 630 | ... දඹර ... ... | 13½ |
| | පස්දුන් කෝරළයේ ප්‍ර. ආ. නි. ගේ කොට්ඨාශය—බටහිර සහ නැගෙනහිර | |
| 829 | ... අගලවත්ත ... | 13 |
| 830 | ... යටියන ... ... | 13 |
| 835 | ... ලත්පඳුර ... ... | 13 |
| 839 | ... බදුරලිය ... ... | 13 |
| 839ඒ | ... මගුර ... ... | 13 |
| 818 | ... වේයන්ගල්ල ... | 13 |
| 819 | ... මහගම ... ... | 13½ |
| 820 | ... දීයකඩුව ... ... | 13½ |
| 823 | ... පින්නගොඩ ... | 13½ |
| 826 | ... ඕමත්ත ... ... | 13½ |
| 827 | ... පිඹුර ... ... | 13½ |
| 827 | ... ගිරිකොළ... ... | 13½ |
| 832 | ... මූලටියන ... | 13½ |
| 833 | ... කිතුල්ගොඩ ... | 13½ |
| 834 | ... යකුපිටිය ... | 13½ |
| 834 | ... බෙල්ලන ... | 13½ |
| 836 | ... පැලැන්ද ... | 13½ |
| 836ඒ | ... මොරපිටිය ... | 13½ |
| 837 | ... මීදලන ... ... | 13½ |
| 837ඒ | ... හැනිගල ... ... | 13½ |
| 838 | ... හැඩිගල්ල ... | 13½ |
| 840 | ... කලුගල ... ... | 13½ |
| 841 | ... අටාල ... ... | 13½ |
| 846 | ... කෙවිටියගල ... | 13½ |
| 870 | ... කූඩලිගම ... | 13½ |
| 828 | ... උඩුවෙල ... | 13½ |
| 788 | ... මකලන්දව ... | 13½ |
| 789 | ... ගුලවිට ... ... | 13½ |
| 822ඒ | ... හල්වතුර ... ... | 13½ |
| 843ඒ | ... පහළහෙවෙස්ස ... | 13½ |
| 844 | ... රත්මලේ ... ... | 13½ |
| 845 | ... කුරුපිටි ... ... | 13½ |
| 848 | ... මොරගල ... | 13½ |
| 850 | ... පැලවත්ත ... | 13½ |
| 821 | ... බුලත්සිංහල ... | 13½ |
| 843 | ... ඉහළ හෙවෙස්ස ... | 14 |
| 812 | ... දේවමුල්ල ... | 14 |
| 813 | ... කොබවක ... | 14 |
| 813 | ... ඉහළ නාරගල ... | 14 |

## 2 වැනි උපලේඛනය—(සම්බන්ධයි)

| කළුතර සහ පානදුර ආදයම් කොට්ඨාශ | 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>සහල් ශුද්ධ රාත්තලකට අය කළ හැකි වැඩිම සිල්ලර මිළ |
|---|---|---|
| ගම්මුලාදැනි කොට්ඨාශය | | ශත |
| 814 | ... ගෝවින්න ... | 14 |
| 814ඒ | ... රැටියල ... ... | 14 |
| 821ඒ | ... දෙලේමැල්ල ... | 14 |
| 822 | ... බෝතලේ ... | 14 |
| 823 | ... යටිගම්පිටිය ... | 14 |
| 824 | ... ඉහල වෙල්ගම ... | 14 |
| 825 | ... මෝල්කාව ... | 14 |
| 825 | ... පරගොඩ ... | 14 |
| 842 | ... බොරළුගොඩ ... | 14 |
| 805 | ... මතුගම ... ... | 13 |
| 792 | ... ලෙව්වන්දුව ... | 13 |
| 793 | ... වැලිපැන්න බටහිර ... | 13 |
| 793ඒ | ... වැලිපැන්න නැගෙනහිර ... | 13 |
| 795 | ... ඕව්ටිගල ... | 13 |
| 804 | ... පාන්තිය ... ... | 13 |
| 807 | ... පහල නැබඩ ... | 13 |
| 773 | ... වලගෙදර ... | 13½ |
| 777 | ... ඉත්තපාන ... | 13½ |
| 779 | ... ලුල්බද්දුව ... | 13½ |
| 780 | ... හල්වල ... ... | 13½ |
| 786 | ... උඩුගම ... ... | 13½ |
| 789 | ... කොටගෙදර ... | 13½ |
| 790 | ... ඌරුගොඩ ... | 13½ |
| 791 | ... පන්නිල ... ... | 13½ |
| 794 | ... හොරවල ... ... | 13½ |
| 796 | ... බදුගම ... ... | 13½ |
| 799 | ... පූහාඹුගොඩ ... | 13½ |
| 800 | ... දෙඩන්ගොඩ ... | 13½ |
| 802 | ... බෝපිටිය ... | 13½ |
| 802ඒ | ... යටදෙලවත්ත ... | 13½ |
| 803 | ... හේනෙගම ... | 13½ |
| 806 | ... ඉදේගොඩ ... | 13½ |
| 808 | ... තුඩුගල ... ... | 13½ |
| 809 | ... තෙබුවන ... | 13½ |
| 810 | ... පැලපිටියගොඩ ... | 13½ |
| 811 | ... කරන්නාගොඩ ... | 13½ |
| 815 | ... නාහල්ල ... | 13½ |
| 816 | ... වරකාගොඩ ... | 13½ |
| 849 | ... මීගහතැන්න ... | 13½ |
| 803 | ... නාරවිල ... ... | 13½ |
| 806 | ... ඉහල නැබඩ ... | 13½ |
| 765 | ... යගිර්ල ... ... | 13½ |
| 782 | ... පරගම ... ... | 13½ |
| 783 | ... ගම්මන ... ... | 13½ |
| 784 | ... කරපගල... ... | 13½ |
| 787 | ... වලල්ලාවිට ... | 13½ |
| 814 | ... ලීනියාව ... | 13½ |
| 781 | ... මතුගම ... ... | 13½ |
| 847 | ... කළුපහන ... | 13½ |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියම මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. ඒ මිළ ගණන්වලට ඉහළින් විකිණිය නොහැකිය.

---

**අංක එච් 35 දරණ ආහාර මිළ නියෝගය** **සහල්**

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක තැන්පත් තම්බයියා සිවඥනම් වන මම්, 3(2) වගන්තිය හා කියවෙන 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(i) 1960 ජනවාරි 4 දින හා අංක 12,029 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1959 දෙසැම්බර් 30 දින හා අංක එච් 34 දරණ මගේ ආහාර මිළ නියෝගයේ 2(ආ) දරණ ඡෙදය මගින් යළි පැනවූ, 1959 අගෝස්තු 14 දින හා අංක 11,833 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1959 අගෝස්තු 11 දින හා අංක එච් 29 දරණ මගේ ආහාර මිළ නියෝගය මේ දුන් සිට අවලංගු කරමි ;

(ii) 1959 ජූලි 17 දින හා අංක 11,811 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1959 ජූලි 15 දින හා අංක එච් 28 දරණ මගේ ආහාර මිළ නියෝගය මේ දුන් සිට අවලංගු කරමි ;

(iii) මීට යාකර ඇති 1 වන උප ලේඛනයේ 2 වන තීරයේ දක්වෙන මිළ, එම උප ලේඛනයේ 1 වන තීරයේ දක්වෙන පෙදෙස්වල සහල් තොග වශයෙන් ශුද්ධ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ වන අතර ඒ මිළට වඩා ඒ පෙදෙස්වල නොවිකිණිය යුතු බව මේ දුන් සිට නියෝග කරමි ;

(iv) මීට යාකර ඇති 2 වන උප ලේඛනයේ 2 වන තීරයේ දැක්වෙන මිළ එම උප ලේඛනයේ 1 වන තීරයේ දැක්වෙන පෙදෙස්වල සහල් ශුද්ධ බර රාත්තල් එකක් විකිණිය හැකි වැඩිම මිළ වන අතර ඒ මිළට වඩා ඒ පෙදෙස්වල නොවිකිණිය යුතු බව මේ දැන් සිට නියෝග කරමි;

(v) මේ නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) සහල් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ සහල් වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ආ) සහල් ඕනෑම ප්‍රමාණයක් පාරිභෝගය හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකන බවත් ;

(ඇ) " රාත්තල " හෙවත් " රා " යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවත් නියෝග කරමි.

(vi) වෙන ද්‍රව්‍යයන් සමග මිශ්‍ර කිරීමෙන් බාල කරන ලද සහල් කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියෝග කරමි ;

(vii) සහල් විකිණීමේ දී එම සහල් යම් දෙයක ඔතනු හෝ අසුරනු හෝ ඇතිනම් එහි මිළද මේ නියෝගයෙන් නියම කරනු ලබන වැඩිම මිළ ගණන්වලට ඇතුලත් බවද නියම කරමි.

(viii) මේ නියෝගයෙන් වැඩිම මිළ නියම කරන සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක හෝ සිය ස්වාමිත්වයේ හෝ සිය පාලනය යටතේ හෝ සහල් තබාගෙන සිටින සෑම වෙළෙන්දෙක්ම මේ නියෝගයෙන් ඒ ප්‍රදේශයට නියම කරන වැඩිම මිළ සඳහන් කරන දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ හෝ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(xi) සිල්ලර වශයෙන් සහල් විකුණන සෑම කෙනෙකුම සහ තොග වශයෙන් සහල් විකුණන සෑම කෙනෙකුම මිළදී ගන්නා ඉල්ලුව හොත් පහත සඳහන් දෑ අඩංගු කුවිතාන්සියක් ඔහුට දිය යුතු බව නියෝග කරමි :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ සහල් ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) විකුණූ ප්‍රමාණයට ගෙවූ මුදල ; හා

(ඈ) වෙළෙඳාමේ ස්වභාවය, එනම් වෙළෙඳාම තොග වශයෙන්ද නැතිනම් සිල්ලර වශයෙන්ද යන බව.

1960 අප්‍රේල් 21 දින පෙරවරු 11 ට හම්බන්තොටදී අත්සන් කරන ලදී.

ටී. සිවඥනම්.
නියෝජ්‍ය මිළ (ආහාර) පාලක තැන,
හම්බන්තොට දිස්ත්‍රික්කය.

## 1 වැනි උපලේඛනය

| | 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>සහල් ශුද්ධ බර හොණ්ඩරයකට අයකළ හැකි වැඩිම තොග මිළ<br>රු. ශ. |
|---|---|---|
| 1. | තංගල්ල ... ... ... ... ... | 14 87½ |
| 2. | බෙලිඅත්ත ... ... ... ... ... | 14 98½ |
| 3. | මහවෙල ... ... ... ... ... | 15 14½ |
| 4. | දෙද්දූවාවල ... ... ... ... ... | 15 15½ |
| 5. | වලස්මුල්ල ... ... ... ... | 15 18½ |
| 6. | වීරකැටිය ... ... ... ... ... | 15 32½ |
| 7. | කිරම ... ... ... ... ... | 15 35½ |
| 8. | කටුවන ... ... ... ... ... | 15 41½ |
| 9. | මිද්දෙනිය ... ... ... ... ... | 15 26½ |
| 10. | හම්බන්තොට ... ... ... ... | 15 62½ |
| 11. | අම්බලන්තොට ... ... ... ... | 15 41½ |
| 12. | තිස්ස ... ... ... ... ... | 16 12½ |
| 13. | රන්න ... ... ... ... ... | 15 62½ |
| 14. | ඉහත සඳහන් නොවූ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ අනිත් සෑම ප්‍රදේශයකම ... | 14 87½ |

## 2 වැනි උපලේඛනය

| | 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>සහල් ශුද්ධ බර රාත්තලකට අයකළ හැකි වැඩිම සිල්ලර මිළ<br>ශත |
|---|---|---|
| 1. | රූකව, තංගල්ල, උනාකුරුව, වල්ගම්එලිය, මාරකොල්ලිය, තේනගම, කදුරුපොකුණ, පොලොන්මාරුව, සිටිනාමලුව, වගේගොඩ, බෙලිඅත්ත, ගොඩවෙල, කහවත්ත, පූවක්දන්ඩාව, දම්මුල්ල, ඉහල බෙලිගල්ල, පහල බෙලිගල්ල, පට්ටියවෙල, සියඹලාගොඩ, වහරක් ගොඩ, තාරපේරිය, ගැටමාන්න උතුර, ගැටමාන්න දකුණ, කුඩාහීල්ල, මහහීල්ල, පල්ලත්තර, සහ පලපොත, යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... ... ... ... | 14 |
| 2. | බෝවල, ගලහිටිය, හොරෙවෙල, ඉත්තදෙමලිය, කඩිගමුව, තලහගම්වාඩුව, වලස්මුල්ල, වාච්ච, කනුමුල්දෙනිය නැගෙණහිර, කනුමුල්දෙනිය බටහිර, කනුමුල්දෙනිය දකුණ, මොදරවාන, යටිගල, කුඩාවැල්ල නැගෙණහිර, කුඩාවැල්ල බටහිර, සිනිමෝදර, නාකුළුගමුව බටහිර, නාකුළුගමුව නැගෙණහිර, දෙද්දූවාවල, අම්බල සහ ගලගම යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... | 14½ |
| 3. | බැදිගම, බුද්දියාගම, ගෝනදෙනිය, මන්ඩාඩුව, මූකිරිගල, යක්ගස්මුල්ල, කිංචිගුනේ, හීල්ලගෙඅයින, වල්ගම්මුල්ල, වෙළෙඳගොඩ, රදනිආර, බූකැන්දයාය, හොරවින්න, ජූලම්පිටිය, ගහලන්දෙනිය, කටුවන, රුක්මල්පිටිය, සියාරපිටිය, තල්වත්ත සහ උඩගොමඩිය යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... ... ... ... | 14½ |
| 4. | හඳුගල, වරාපිටිය, පාතෙගම සහ පිගලැල්ල යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... ... | 15½ |
| 5. | මිද්දෙනිය, සපුගහයාය, ලබුහේන්ගොඩ, මැල්ලකැටිගොඩ, මුරුන්ගස්යාය, වැලිපිටිය, කුඩාගල්ආර, කුඩාගොඩ, තලාව, දෙබොක්කාව, දබරැල්ල, සහ ඕකන්දයාය යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... ... | 14½ |
| 6. | අබේසේකරගම, උස්වැව සහ සියඹලාකොටේ යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... ... | 14½ |
| 7. | වැලිපටන්විල, මිණිඇතිලිය, මාමඩල, තවාලුවිල, ලූනම, බැමිණියන්විල, හාතගල, වාදුරුප්ප, බෝලාන, බැරගම, වලවෙ, ඇත්බටුව, පල්ලෙගම, අඟුණුකොලපැලැස්ස, මුලන, කොග්ගල්ල සහ බටඅත යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... | 14½ |
| 8. | හම්බන්තොට නගර සභා ප්‍රදේශය ... ... ... ... ... ... | 14½ |
| 9. | බුන්දල, ගොන්නොරුව, කොහොලන්කල, ඉහල කුඹුක්වැව සහ වැලිවැව යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... | 15 |
| 10. | රනකෙළිය දකුණ, රණකෙළිය උතුර, උඩුවිල, තිස්ස උතුර, තිස්ස දකුණ, සහ වීරවිල යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... | 15 |
| 11. | වත්තල සහ අඟුණකොළවැව යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... ... ... | 15½ |
| 12. | ජූලමුල්ල, පට්ටියාපොල, උඩයාල, හීන්බුන්න, දහඅමුන, හකුරුවෙල, මැදගොඩ, විකාරන්දෙනිය සහ වකමුල්ල යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... ... ... ... ... | 14½ |
| 13. | කිරින්ද සහ මාගම යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... ... ... ... | 15½ |
| 14. | ගුරුපොකුණ, නෙටොල්පිටිය, විගමුව, කහඳාමෝදර සහ රන්න යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... | 14½ |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් සහල් විකිණීමේ නියමිත මිළ නොවේ. මේ එම සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් සහල් විකිණිය නොහැකිය.

**1960 අංක ඇම්. ඇන්/5 දරණ ආහාර මිළ නියෝගය** — **අතිරේක ආහාර ද්‍රව්‍ය (මයිසූර් පරිප්පු)**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**අවලංගු කිරීමේ නියෝගය**

මන්නාරම් දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් සන්මුගම් පරමනාදන් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමඟ කියැවෙන 4 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

1960 ජනවාරි මස 27 වෙනි දින අංක 12,045 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 1960 අංක ඇම් ඇන්/1 හා 21.1.60 වෙනි දින දරණ මයිසූර් පරිප්පු සම්බන්ධ මිළ නියෝගය අද සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

1960 අප්‍රෙල් මස 21 වෙනි දින අපරභාග 3 ට මන්නාරම් කච්චේරියේදී අත්සන් තබන ලදී.

ඇස්. පරම්නාදන්,
මන්නාරම් දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

---

**අංක කේ.යූ/6/60 දරණ ආහාර මිළ නියෝගය** — **මයිසූර් පරිප්පු**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**අවලංගු කිරීමේ නියෝගය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත්, විල්ප්‍රඩ් ප්‍රැන්සිස් ප්‍රදිනාන්දු වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් හා 3(2) වැනි ඡෙදයන්ගෙන්ද මා වෙත පැවරී ඇති බලතල අනුව 1960.2.8 වැනි දින හා 12,057 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ 1960.2.2 වැනි දතමින් පළකරන ලද අංක කේ.යූ./1/60 දරණ මගේ ආහාර මිළ නියෝගය මේ දින් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

1960 අප්‍රියෙල් මස 21 වැනි දින පස්වරු 3 ට කුරුණෑගල කච්චේරියේදී අත්සන් තබන ලදී.

ඩබ්ලිව්. ඇෆ්. ප්‍රදිනාන්දු,
, කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

---

**ඇෆ්.සී/ඇම්/29 අංකය දරණ ආහාර මිළ නියෝගය** — **අතිරේක ආහාර ද්‍රව්‍ය (මසූර් පරිප්පු)**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**අවලංගු කිරීමේ නියෝගය**

පුත්තලම් දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් ජෝන් වින්ස්න්ට් ඥානප්‍රගාසම් වන මම, 1950 හේ අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) ත් සමඟ කියවිය යුතු 4 වෙනි වගන්තියෙන් මට පැවරී ඇති බලතල අනුව, 1960 ජනවාරි 29 වෙනි දිනය හා අංක 12,048 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 1960 ජනවාරි 25 වෙනි දිනය හා ඇෆ්.සී/ඇම් 25 වැනි අංකය දරණ මයිසූර් පරිප්පු පිළිබඳ නිකුත්කරන ලද ආහාර මිල නියෝගය මේ දින් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

1960 අප්‍රෙල් මස 21 දින පෙරවරු 10 ට පුත්තලමේ දී අත්සන් කරන ලදී.

ජෝ. වි. ඥනප්‍රගාසම්,
පුත්තලම් දිස්ත්‍රික්කයේ සහකාර මිල (ආහාර) පාලක.

---

**අ. 70 දරණ ආහාර මිළ නියෝගය** — **අතිරේක ආහාර ද්‍රව්‍ය (මසූර් පරිප්පු)**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**අවලංගු කිරීමේ නියෝගය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් ජෝන් ක්ලැරන්ස් ලක්ෂ්මන් මෙල්ඩර් ගුණරත්න වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) වැනි වගන්තිය සමඟ කියවිය යුතු 4 වැනි වගන්තියෙන් මාවෙත පැවරී තිබෙන බලතල අනුව, 1960 ජනවාරි මස 18 වැනි දිනය හා 12,037 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරනලද 1960 ජනවාරි මස 11 වැනි දිනය හා අ.65 වැනි අංකය දරණ මයිසූර් පරිප්පු පිළිබඳ නිකුත් කරනලද ආහාර මිළ නියෝගය මේ දින් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

1960 අප්‍රෙල් මස 21 වෙනි දින පස්වරු 3.30 ට අනුරාධපුරයේදී අත්සන් කරනලදී.

ජේ. සී. ඇල්. ඇම්. ගුණරත්න,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලකතැන.

---

**අංක පී.ඇල් 6/60 දරණ ආහාර මිළ නියෝගය.** — **අතිරේක ආහාර ද්‍රව්‍ය (මයිසූර් පරිප්පු.**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**අවලංගු කිරීමේ නියෝගය**

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් චාර්ල්ස් අබෙදීර වන මම, 1950 හේ අංක 29 දරණ මිළ පාලන පනතෙහි 3(2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු 4 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව : 1959 ජූනි මස 4 වැනි දිනය හා පී. එල්. 3/59 වැනි අංකය දරණ අංක 11,769 හා 1959 ජූනි 10 වැනි දිනය දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද මයිසූර් පරිප්පු පිළිබඳ ආහාර මිළ නියෝගය මේ දින් පටන් මෙම නියෝගයෙන් අවලංගු කරමි.

1960 අප්‍රෙල් මස 19 වැනි දින පෙරවරු 9.30 ට පොළොන්නරුවේ කච්චේරියේදී අත්සන් තබන ලදී.

සී. අබෙදීර,
පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන.

අංක පී.ඇල් 7/60 දරණ ආහාර මිළ නියෝගය  වී (තොග සහ සිල්ලර)

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් චාර්ල්ස් අබේදීර වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතෙහි 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව—

(1) 1959 දෙසැම්බර් 21 වැනි දින අංක 12,015 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද අංක පී.එල්/16/59 සහ 1959 දෙසැම්බර් 14 වැනි දින දරණ ආහාර මිළ නියෝගය 1960 අප්‍රේල් 11 වැනි දින සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උප ලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් පෙදෙස්වල වෙළඳාම කරගෙන යන ආහාර පාලනය සඳහා පත්කරන ලද බලය ලත් වෙළඳුන්ට නියමිත වී ප්‍රමාණය සඳහා බෙද හරින වී තොග වශයෙන් ශුද්ධ කිරුමෙන් හොණ්ඩරයක් විකිණීමේ වැඩිම මිල 1960 අප්‍රේල් මස 11 වැනි දින සිට එම උපලේඛනයේ 2 වැනි තීරයේ පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මීට යාකර ඇති උප ලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් පෙදෙස්වල නියමිත වී ප්‍රමාණය සඳහා බෙද හරින වී වලින් සිල්ලර වශයෙන් ශුද්ධ කිරුමෙන් රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ 1960 අප්‍රේල් 11 වැනි දින සිට එම උප ලේඛනයේ 3 වැනි තීරයේ පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(4) 1959 දෙසැම්බර් 12 වැනි දින අංක 12,015 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද වී සම්බන්ධ අංක පී.එල් 16/59 හා 1959 දෙසැම්බර් 14 වැනි දින දරණ ආහාර මිළ නියෝගයේ (4) සිට (8) දක්වා ඡෙදයන් මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1960 අප්‍රේල් මස 19 වැනි දින පෙරවරු 10 ට පොළොන්නරුව කච්චේරියේදී අත්සන් තබන ලදී.

සී. අබේදීර,
සහකාර මිළ (ආහාර) පාලක තැන, පොළොන්නරුව.

### උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය |
|---|---|---|
| කොට්ඨාශය | නියමිත වී ප්‍රමාණය සඳහා බෙද හරින වී වල ශුද්ධ කිරුමෙන් හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිල | නියමිත වී ප්‍රමාණය සඳහා බෙද හරින වී වල ශුද්ධ කිරුමෙන් රාත්තලක් විකිණිය හැකි වැඩිම මිල |
| | රු. ශ. | රු. ශ. |
| සිංහල පත්තුව ... ... ... | 7 22 ... | 0 07 |
| මැද පත්තුව ... ... ... | 7 29½ ... | 0 07 |
| එගොඩ පත්තුව ... ... ... | 7 38 ... | 0 07½ |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් වී විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේ මිළ ගණන් වී විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. එයට වඩා වැඩි මිළට වී විකිණිය නොහැකියි.

---

ආර්/8/1960 වැනි අංක දරණ මිළ (ආහාර) නියෝගය  සහල්

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් හේවා ඩැනී වීරරත්න වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1959 අගෝස්තු මස 10 වෙනි දින අංක 11,830 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනලද 1959 අගෝස්තු මස 4 වෙනි දින අංක ආර්./24/1959 දරණ මගේ ආහාර මිළ නියෝගය අද දින සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) සහල් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක් මීට යාකොට ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශ සීමාවන් ඇතුළත තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ 1960 අප්‍රියෙල් මස 11 වෙනි දින පටන් මෙහිම 2 වෙනි තීරයේ සඳහන් කර තිබෙන මිළ ගණන් වන අතරම ඒ මිළ ගණන්වලට වඩා වැඩියෙන් සහල් නොවිකිණිය යුතු බව මෙයින් නියෝග කරමි.

(3) සහල් සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තල් දෙකක් මීට යාකොට ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශ සීමාවන් ඇතුළත සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ 1960 අප්‍රියෙල් මස 11 වෙනි දින පටන්, මෙහිම 3 වෙනි තීරයේ සඳහන් කර තිබෙන මිළ ගණන් වන අතරම ඒ මිළ ගණන්වලට වඩා වැඩියෙන් සහල් නොවිකිණිය යුතු බව මෙයින් නියෝග කරමි.

(4) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) සහල් ඕනෑම ප්‍රමණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට සහල් ශුද්ධ බර හොණ්ඩරයකට වඩා වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමකට හෝ විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) සහල් පරිභෝගය පිණිස හෝ පාවිච්චි පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සහල් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවත් නියම කරමි.

(6) තවද, සහල් විකුණන විට එය යම්කිසි දෙයක ඔතා හෝ බහා දෙන දෙයක් වෙතොත් එහි මිළත් මෙම නියෝගයෙන් නියම කරනලද වැඩිම මිළ ගණන්වලට ඇතුළත් බවද මෙයින් නියෝග කරමි.

(7) තවද, යම් ස්ථානයක හෝ වාහනයක සහල් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව මෙයින් නියෝග කරමි.

(8) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා " රාත්තල " හෙවත් " රා " යනුවෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(9) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සහල් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සහල් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ සහල් ප්‍රමාණය ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දියයුතු බවද නියම කරමි.

1960 අප්‍රියෙල් මස 19 වෙනි දින පස්වරු 2 ට රත්නපුර කච්චෙරියේදී අත්සන් තබන ලදී.

එච්. ඩී. වීරරත්න,
රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

## උපලේඛනය

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>සහල් ශුද්ධ බර හොණ්ඩරයකට අයකළ හැකි වැඩිම තොග මිළ<br>රු. ශ. | | 3 වෙනි තීරය<br>සහල් ශුද්ධ බර රාත්තල් 2කට අයකළ හැකි වැඩිම සිල්ලර මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| **(1) නවදුන් කෝරළය—** | | | |
| (අ) තිරිවානකැටිය, බටුගෙදර නගර සභා ප්‍රදේශය, මාරපොන (කරත්ත පාරෙහි), පැල්වාඩිය, කැටන්දොල, දූල, නිවිතිගල වසම, වටාපොත, ඇලපාත, අලුකැටිය, ඇත්ඔය (නගර සභා ප්‍රදේශයෙන් පිටත) සහ ගැටන්ගම (නගර සභා ප්‍රදේශයෙන් පිටත) ... ... ... | 13 90½ | ... | 0 26 |
| (ආ) පැල්මඩුල්ල, මීගහගොඩ, බත්ගන්ගොඩ, පාතකඩ, මිදිගහමුල්ල, කාමරංගාපිටිය මොරතොට, කුට්ටාපිටිය, නාරංගොඩ, ගනේගම, බෝපිටිය, රිල්හේන, කෙටේතැන්න, පනාවැන්න, ලෙල්ලෝපිටිය, බැරැන්ඩුව, දිප්පිටිගල, පනගම, වැලිමලුව, ගෝනාකුඹුර, හකමුව, මාරපොන, (ගහෙන් එගොඩ), කොලොන්ඩගල, කරවිට, පැබොටුව, එරබැද්ද, කිරිබත්ගල, දොලොස්වල වසම, වේරගම, අමුවල වසම, උඩවටන, පොරහිටිගම, වැරනියාගොඩ, සහ දෙමළ පෝරුව ... ... ... ... | 14 00½ | ... | 0 26½ |
| (ඇ) සන්නස්ගම, පොරෝනුව, බෝපැත්ත, දෙල්වල, මිල්ලවිටිය, කෙහෙල්ඔවිටිගම, දෙල්ලබොඩ, රද්දැල්ල, හංගොමුව, පලාවෙල, කරංගොඩ, නිරිඇල්ල, ගල් ලැල්ල, නුගේපොල සහ හපුරුපොල ... ... ... | 14 11½ | ... | 0 27 |
| (ඈ) බුලත්වත්ත, ඉල්ලුබුළුව, දිමියාව, දඹුළුවන සහ හපුගස්තෙන්න ... | 14 22½ | ... | 0 27½ |
| (ඉ) ගුරුබැවිලෙගම, කෙකටියවෙල සහ ඉහතින් සඳහන් නොකළ සෑම ප්‍රදේශයක්ම | 14 32½ | ... | 0 28 |
| **(2) කුරුවිටි කෝරළය—** | | | |
| (අ) රත්නපුර නගරසභා ප්‍රදේශය සහ වෙරලුපේ ... ... | 13 90½ | ... | 0 26 |
| (ආ) ඇහැලියගොඩ, කඳන්ගොඩ, කුරුවිට, හිග්ගස්හේන, එක්නෙලිගොඩ, කැන්දන් ගොමුව වටුම, පැල්පිටිය, තොරණ කඩ, විලේගොඩ, බුළුගහපිටිය, කැන්දන් ගොමුව පහලහම, කැන්දන්ගොමුව ඉහළගම සහ මීන්නාන ... | 13 73½ | ... | 0 26 |
| (ඇ) මිල්ලවිටිය, කොක්කෝවිට, පූස්ඇල්ල වතුයාය, ක්‍රැන්ඩන් වතුයාය, බටුහේන, මාන්ගෙදර, ඒදන්ඩවෙල, ගෝනාපිටිය, තැඹිලියාන, කොස්ගල, ඉද්දමල් ගොඩ, පරණගම, පහලකන්ද, අකුරණ, පෙහොරබාව, තලාපිටිය, දිගෝගෙදර, එල්ලාවල, බෝදිමලුව, කිරිපෝරුව, මුත්තෙට්ටුපිටිය, පනුකැරැපිටිය, මලංගම, මීහිටිය, කහන්ගම, දේවාලෙගාව, හොලිපිටිය සහ මල්වල ... | 13 90½ | ... | 0 26½ |
| (ඈ) වැලිකඹුර, බටහිරකරඳන, නුගදන්ඩ, වෑවිල, ඇල්ලෙගෙදර, දොඩම්පෙ, බල ගන්ගොඩ, දූරෙගෙකන්ද, ඉලුක්වත්ත, පාගොඩ, තැන්නෙහේන, ඉඹුල්දෙනිය, ගුරුළුවාන, මැදගම, යටිපව්ව සහ ඇල්ලගාව ... ... | 14 14½ | ... | 0 27 |
| (ඉ) කිරිඇල්ල ... ... ... ... | 14 25½ | ... | 0 27 |
| (ඊ) හල්පෙ, දෙවිපහල, තෙප්පනාව, නැදුරන, ඇරැපොල, කුම්මෝදර, මාවුවාගල, එපිටවල, මැදකන්ද, කහවත්ත, පල්ලෙපත්තු සහ නැගෙනහිර කරඳන ... | 14 22½ | ... | 0 27½ |
| (උ) හිඳුරන්ගල ගැටහැත්ත, දූරම්පිටිය, නාපාවල, මාරඹේ, ඉලුක්පිටිය, මාරඹේකන්ද සහ හේවාහින්නේ කන්ද ... ... ... | 14 32½ | ... | 0 28 |
| (ඌ) අඩවිකන්ද, මුත්තෙට්ටුවෙ කන්ද, ගහබොඩ සහ පලාබද්දල ... ... | 14 42½ | ... | 0 28½ |
| (එ) කුඩාව ... ... ... ... | 14 52½ | ... | 0 29 |
| (ඒ) කොස්ගහකන්දෙවත්ත සහ ඉහතින් සඳහන් නොකළ සියලුම ප්‍රදේශ ... | 14 62½ | ... | 0 29½ |
| **(3) කඩවත සහ මැද කෝරළය—** | | | |
| (අ) ඕපනායක ගම්සභා වටුම, හුනුවල, උඩ වෙල, මාදොල, හොරකැටිය, ඕපනායක වසම සහ අකරැල්ල ... ... ... ... | 13 90½ | ... | 0 26 |
| (ආ) පනාන ... ... ... ... | 14 00½ | ... | 0 26½ |
| (ඇ) කොන්ගස්තැන්න, කන්දෙකැටිය, බලන්ගොඩ නගර සභා ප්‍රදේශය, බලන්ගොඩ වසම, කිරිමැටිතැන්න වසම, දිගදූරෙ, මස්හේන වසම, අමුපිටිය, රත්මලවින්න, ඇල්ලෙඅරාව සහ ඕලුගන්තොට ... ... ... | 14 21½ | ... | 0 27 |
| (ඈ) මහවලතැන්න, ගල්ගොඩලහ, හතර බාගේ, මොරහැල, කෙසෙල්කොරටුව, කිරුපනාවල, වෙගපිටිය, රාස්සගල, වසම, ඉඹුල්පෙ, අලුත්නුවර, දෙපල මුල්ල, වැලිගෙපොල, නෙල්ලිවල, මාරතැන්න, පඹගොල්ල, ගලගම වසම, පුවක්ගහවෙල, දෙනගම, හල්පෙ වසම, පන්නවල, කනතිරියන්වෙල, උඩගල් අරාව, අටවක්වෙල සහ බොල්තුඹේ වසම ... ... ... | 14 39½ | ... | 0 27½ |
| (ඉ) ඌරවෙල, කන්ගම, නොන්පෙරිල් ගෲප්, බෙලිහුල්ඔය සහ ඉහතින් සඳහන් නොකළ සියලුම ප්‍රදේශ ... ... ... ... | 14 49½ | ... | 0 29 |

උපලේඛනය—(සම්බන්ධයි)

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>සහල් ශුද්ධ බර හොණ්ඩරයකට අය කළ හැකි වැඩිම තොග මිළ<br>රු. ශ. | 3 වෙනි තීරය<br>සහල් ශුද්ධ බර රාත්තල් 2 කට අය කළ හැකි වැඩිම සිල්ලර මිළ<br>රු. ශ. |
|---|---|---|
| **(4) අටකලං කෝරළය—** | | |
| (අ) කහවත්ත ගම්සහා ටවුම්සහ නුගෙවෙල | 13 90½ | 0 26 |
| (ආ) අටකලංපන්න, යාහින්න, කොටකෙතන, නැබුලුව, බුංගිරිය, වෙල්අඳුර, හපුරු-දෙනිය සහ දිඹුල්වෙල | 13 97½ | 0 26½ |
| (ඇ) යටාගර, හොරහින්ඇල්ල, හවුපෙ, රිදීවිට, හිරමඩගම, කලල්ඇල්ල, ඇල්පිටිය, මාදම්පෙ, ඇන්දන සහ පනාපිටිය, රක්වාන සුළු නගර සභා ප්‍රදේශය සහ රක්වාන වසම | 14 35½ | 0 27 |
| (ඈ) ගොඩකවෙල, වේරහැර, මල්වත්ත, මස්ඉඹුල, ඇමටියගොඩ, ගලහිටිය, පල්ලෙගම සහ කොස්නාතොට | 14 22½ | 0 27 |
| (ඉ) මඩලගම, මාකඳුර, පනාවල, ගහලවෙල, හපුගස්තෙන්න, පල්ලෙවෙල, කොස්වැටිය, බලවින්න සහ පල්ලේබැද්ද | 14 32½ | 0 27½ |
| (ඊ) පන්නිල, නාවින්න, පලම්කෝට්ටෙ පිටවල සහ තිඹොල්කැටිය | 14 42½ | 0 28 |
| **(5) කුකුල් කෝරළය—** | | |
| (අ) සිංහලගොඩ, ඉන්දෙලවත්ත, සහ උක්වත්තකන්ද | 14 42½ | 0 27 |
| (ආ) කොස්වත්ත, කලවාන, වේවැල්කඳුර, අයගම, නම්මුනියාවත්ත, ගලතුරේ, කන්දවත්ත, ඇරැපෝරුව, පල්ලෙකන්ද, මඩබද්දර දුම්බර සහ කැටේපොල | 14 42½ | 0 27½ |
| (ඇ) වැද්දගල, පනහැටගල (නවදුන් කෝරළේ), දෙලකන්ද | 14 52½ | 0 28½ |
| (ඈ) ගවරගිරිය සහ කත්ලෙන | 14 62½ | 0 29½ |
| (ඉ) පනාපොල සහ ඉහතින් සඳහන් නොකළ සියලුම ප්‍රදේශ | 14 72½ | 0 30 |
| **(6) කොළොන්නා කෝරළය—** | | |
| (අ) සූරියකන්ද, බුලුතොට, ඉත්තැකන්ද සහ පොද්දන | 14 95½ | 0 28½ |
| (ආ) විජේරිය, කොළොන්න, හල්වින්න, හෙලඋඩකන්ද, ඇඹිලිපිටිය, පල්ලෙගම, ඉහළගම, පන්හිල්කන්ද, කොස්තනගහවත්ත සහ බොරලුවෙගෙ අයින | 14 62½ | 0 29 |
| (ඇ) කෝප්පකන්ද සහ ඉහතින් සඳහන් නොකළ සියලුම ප්‍රදේශ | 14 72½ | 0 30 |

සැළකිය යුතුයි.—(1) මේ මිළ ගණන් සහල් විකිණීමේ නියමිත මිළ නොවේ. මෙවා සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන් ය. මේ මිළ ගණන්වලට වඩා වැඩියෙන් සහල් විකිණිය නොහැක.

(2) ශුද්ධ බර හොණ්ඩරයකට අඩු යම්කිසි සහල් ප්‍රමාණයක් තොග වශයෙන් විකිණීමේ දී ගෙවිය හැකි වැඩිම මිළ, ඉහත සඳහන් කර තිබෙන ශුද්ධ බර හොණ්ඩරයක වැඩිම මිළ ප්‍රමාණයන් අනුව ගණන් බලා ගත් මිළ විය යුතු යි.

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ආහාර පාලන දැන්වීම

### 19 වැනි වාරයේ අතිරේක සලාක පොත්වල කූපන් වලංගු තාවය

අංක 12,110 සහ 60.4.20 දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරණ ලද 60.4.18 දතම දරණ ආහාර පාලන දැන්වීම අවලංගු කරන ලද බව මෙයින් දන්වමි.

අංක 12,002 සහ 59.12.11 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරණ ලද 59.12.3 දතම දරණ මගේ දැන්වීමෙහි පරිදි 19 වෙනි වාරයේ අතිරේක සලාක පොත්වල කූපන් වල වලංගුතාවය නොවෙනස්ව පවතී.

කේ. අල්වාපිල්ලෙයි,
වැඩ බලන ආහාර කොමසාරිස් සහ වැඩ බලන ආහාර පාලක.

1960 අප්‍රේල් 22 දින,
කොළඹ දීය.

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රණය කරන ලදී.